# දඹදෙණිය යුගයෙහි යාවත්කාලීන කලා නිර්මාණවලින් ප්‍රදර්ශනය වන දකුණු ඉන්දීය දේශපාලන-සමාජ-සංස්කෘතික ආභාෂණය පිළිබඳ විමසුමක් (ප්‍රාථමික හා ද්විතීක ලිඛිත මූලාශ්‍රය ආශ්‍රයෙන්)

ජයතිලක ආර්.ඒ.ටී.එම්.[1], ජයතුංග එම්.ජී.එස්.කේ.[2] සහ කිච්ල් ටී.ආර්.[3]

[1]මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[2]පරිසර කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[3]භාෂා අධ්‍යනාංශය,සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
thilinamjayathilaka@gmail.com

**සාරසංක්ෂේපය**

සියවස් පහළවකට අධික කාලයක් ස්ථාවරව පැවති රජරට රාජධානිය ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝ විසින් වැනසීමෙන් පසු ද්‍රවිඩාධිපත්‍යයට නතු විය. දඹදෙණිය ඇරඹූ තුන්වන විජයබාහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු ක්‍රි.ව.1236දී මාඝ පරදා රට එක්සේසත් කළේය. එතැන් සිට ක්‍රි.ව.1271 පමණ දක්වා ලංකාවේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වූයේ දඹදෙණියයි. දඹදෙණි කලා නිර්මාණවලින් ප්‍රදර්ශිත දකුණු ඉන්දීය දේශපාලන-සමාජ-සංස්කෘතික ආභාෂණය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. දඹදෙණි කලා නිර්මාණවලින් ඉන්දීය දේශපාලන-සමාජ-සංස්කෘතික ලක්ෂණ කෙතරම් දුරට ප්‍රදර්ශනය වන්නේද යන්න මෙහි පර්යේෂණ ගැටළුවයි. දඹදෙණි කලා නිර්මාණවල දකුණු ඉන්දීය ලක්ෂණ හඳුනාගැනීම, ලංකාවත් ඉන්දියාවත් අතර පැවති කාලානුරූපී විවිධ සම්බන්ධතා ලාංකේය කලාව පෝෂණයට පසුබිම් වූ ආකාරය විමසීම මෙහි අරමුණු වේ. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීක ලිඛිත මූලාශ්‍රය අධ්‍යයනය යොදා ගැනුණි. පුරාවිද්‍යාත්මකවත් සාහිත්‍යාත්මතවත් හඳුනාගෙන ඇති දඹදෙණි යුගයට අයත් කලා නිර්මාණ බොහෝමයකින් දකුණු ඉන්දීය දේශපාලන-සමාජ-සංස්කෘතික ආභාෂණය ප්‍රදර්ශනය වේ. දඹදෙණි යුගයේ යාවත්කාලීන දෙවුන්දර උපුල්වන් දේවාලයට චන්ද්‍රභාණුව පැරදූ දෙවන වීරබාහු (පැරකුම්බාගේ මාපා) විසින් පූජාවක් සිදුකළ බව මහාවංශයේ දැක්වේ. හින්දු සභ්‍යත්වයේ පැවති යුද්ධය සඳහා දේව පූජෝපහාරයන් කිරීමේ පිළිවෙත වීරබාහු ආදර්ශයට ගන්නට ඇත. දේවපතිරාජ ඇමති කාලිගෝ මුවදොර අසූරියන් ගෙයක් කරවූ බව මහාවංශයේ දැක්වේ. මෙම මුවදොර බෙන්තර ගඟ අසබඩ පිහිටි බව මතයයි. පරෙවි සංදේශය පවසන බෙන්තර ගඟබඩ කාලි කෝවිල පතිරාජගේ ඉදිකිරීම බවත්, දකුණු ඉන්දීය ලක්ෂණ සහිත ගලපාත විහාරයේ උළුවස්ස එම කෝවිලට අයත් වූවක් බවත් පිළිගනී. දඹදෙණි සමයේ යාවත්කාලීන මුන්නේශ්වරම්-මැදවත්ත-මෝරගම-කුඹුල්ල-මාපිටිය ආදී දේවාල සම්ප්‍රදාය මෙරටට පැමිණියේ ද දකුණු ඉන්දියාවෙනි. හත්තවනගල්ල විහාරවංසය කියන දෙවන පැරකුම්බා කරවූ අටැස් පිළිමගෙය පූර්වයේ මෙරට නොවූ දකුණු ඉන්දීය ආභාෂ ලද නිර්මාණයකි. බෙලිගල දළදා මාලිගයේ සඳකඩ පහණ, දඹදෙණි රජමහා විහාරයේ කොරවක්ගල් දකුණු ඉන්දියාවේ සංස්කෘතිය මොනවට ප්‍රකට කරයි. සඳකඩ පහණින් ගවයා ඉවත්කර ඇත. පෙර නොවූ ලෙස මධ්‍යයෙහි පූර්ණ පද්මයක් අඹා ඇත. කොරවක්ගල් පාමුල මුරගල් නොමැත. ඇත් රූප ද්විත්ත්වයකින් කොරවක්ගල් දක්වා ඇත. දකුණු ඉන්දීය 'පතාක් චිත්‍ර' අනුසාරයෙන් මෙරට ඇතිවූ පෙතිකඩ චිත්‍ර ද දඹදෙණියෙන් ඇරඹි විශිෂ්ට කලා සම්ප්‍රදායකි. මෙකී දඹදෙණි කලා නිර්මාණවලින් දකුණු ඉන්දීය දේශපාලන-සමාජ-සංස්කෘතික ආභාෂණය ප්‍රදර්ශනය වන අතර කාලානුරූපීව දෙරට අතර ක්‍රියාත්මක වූ දේශපාලන-ආර්ථික-සමාජ-ආගමික-සංස්කෘතික සම්බන්ධතා ඊට මුල් වූ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** *දඹදෙණිය, දකුණු ඉන්දීය, දේශපාලන, සමාජ, සංස්කෘතික*